සමාජ සමීක්ෂා, වෙළුම 1, කලාපය 2, පිටු අංක 9-24, 2016

සමාජ සමීක්ෂා: සමාජීය විද්‍යා ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය
ISSN 2478-0472
http://www.socialaffair.org

# ශ්‍රී ලංකාවේ භික්ෂු අධ්‍යාපනයේ නියමුවෝ

## මහතෙරුන් වහන්සේලා සහ ධර්මභාණකයන් වහන්සේලා පිළිබඳ බ්‍රාහ්මී ලිපි හා සාහිත්‍ය මූලාශ්‍රය ආශ්‍රිත අධ්‍යයනයක්

පියතිස්ස සේනානායක*
පුරාවිද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ භික්ෂු අධ්‍යාපනයේ ආරම්භය හා වර්ධනය සම්බන්ධයෙන් මහතෙරුන් වහන්සේලා සහ ධර්මභාණකයන් වහන්සේලාට මූලික තැනක් හිමි විය. ආරාමික ජීවිතය පදනම් කරගත් භික්ෂු අධ්‍යාපනය ආචාර්ය, උපාධ්‍යාය හා අන්තේවාසික, සද්ධිවිහාරික යන සිව් පිරිස හා බැඳී පැවතුණි. ගුරු-ශිෂ්‍ය පරම්පරා අනුව දැනුම පරපුරකින් තවත් පරපුරකට හිමි විය. ධර්ම කරුණු පැහැදිලි කිරීමේ දී ගුරුවරයා හා ශිෂ්‍යයා අතර මතවාද පැණනැගුණු අවස්ථා මෙන් ම ශිෂ්‍යාගේ මතය නිවැරදි බව පිළිගත් අවස්ථා පැවතුණි. ගුරු-ශිෂ්‍ය සබඳතාවයට එය ගැටලුවක් නොවීය. මේ සම්බන්ධ ව සාහිත්‍ය මූලාශ්‍රයන්හි ඇතුළත් නොවන ඇතැම් වැදගත් කරුණු පැරණි බ්‍රාහ්මී ලිපිවල අන්තර්ගත ව පවතී. පසුකාලීන ව රචනා වූ වංසකථාවල වර්ණනාත්මක ව ඉදිරිපත් කර ඇති ඇතැම් මහතෙරවරුන් සහ තෙරණිවරුන් පිළිබඳ ව කිසිඳු තොරතුරක් අභිලේඛනවල ඇතුළත් වී නැත. සම්පූර්ණ ත්‍රිපිටකය ම හදාළ මහතෙරවරුන් කිහිපදෙනෙකු ගැන පාලි අට්ඨකථාවල සඳහන් වුවත් බ්‍රාහ්මී ලිපිවලින් එවැන්නක් හෙළිදරව් නොවේ. සාහිත්‍ය මූලාශ්‍රයන්හි ඇතුළත් කරුණු පමණක් සලකා බලා භික්ෂු අධ්‍යාපනයේ නියමුවන් වූ තෙරුන් වහන්සේලා සහ ධර්මභාණකයන් වහන්සේලා පිළිබඳ ව තීරණයකට එළැඹීම අපහසු ය.

**මූලික පද:** භික්ෂු අධ්‍යාපනය, මහතෙරුන් වහන්සේලා, බ්‍රාහ්මී ලිපි

### හැඳින්වීම

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ගෝත්‍රය හෝ කුලය පදනම් කර ගත් ඉතාමත් ප්‍රාථමික තත්ත්වයෙන් ආරම්භ වූවක් විය. ප්‍රාග් ඓතිහාසික යුගයේ විසූ මිනිසා තම පරිසරය හා සමාජය පිළිබඳ දැනුම ලබා ගත්තේ තමා ඇසුරු කළ ගෝත්‍රයේ හෝ පවුලේ වැඩිහිටියන් වෙතිනි (සේනානායක, 1993, පි. 97-101). නමුත් ශිෂ්ටාචාරයට පය තැබීමත් සමඟ එය දේශපාලනික හා ආගමික ආයතන ප්‍රධානීන් වෙත පැවරුණු වගකීමක් බවට පත්විය. ශ්‍රී ලංකාවේ ප්‍රාග් බෞද්ධ යුගයේ පැවති ඇදහිලි ක්‍රම හා විශ්වාස පිළිබඳ ව සෙනරත් පරණවිතාන ලියූ ලිපියේ (1929, පි.. 202-328) අන්තර්ගත තොරතුරු අනුව බුදු දහම පැමිණීමට පෙර ශ්‍රී ලංකාවේ පැවති අධ්‍යාපනික තත්ත්වය පිළිබඳ ව ද යම් ආකාරයක

*කර්තෘ විද්‍යුත් ලිපිනය:
piyathissa_senanayake@yahoo.com
©2016 සමාජ සමීක්ෂා. This work is licensed under a Creative Commons Attribution-Non Commercial 4.0 International License.

අනුමානයක් කළ හැකි ව පවතී. විශේෂයෙන් ම ජෛන ආගමික නායකයන් බෞද්ධ භික්ෂූන්ට පෙර මෙම දිවයිනට පැමිණ සිටියේ නම් සමාජය තුළ අධ්‍යාපනික කාර්ය භාරයෙහි සුවිශේෂ තැනක් ඔවුන්ට හිමිවී තිබෙන්නට ඇත. නමුත් බුදු දහම පැමිණීමත් එයට රාජ්‍ය අනුග්‍රහය ලැබීමත් සමඟ බෞද්ධ භික්ෂූන් වහන්සේලාට අධ්‍යාපන කාර්යයන්හි මූලිකත්වය හිමිවූ බවක් ඓතිහාසික මූලාශ්‍රයන් පරිශීලනයේ දී පැහැදිලි වේ (රාහුල හිමි, 1993, පි. 299-315).

මෙම ලිපියෙහි අරමුණ වන්නේ අතීත ශ්‍රී ලංකාවේ භික්ෂු අධ්‍යාපන කටයුතුවල මූලිකත්වය ඉසිලූ මහතෙරුන් වහන්සේලා සහ ධර්මභාණකයන් වහන්සේලා සම්බන්ධ ව පැරණි බ්‍රාහ්මී ශිලාලේඛනවලින් හෙළිවන කරුණු පිළිබඳ පර්යේෂණාත්මක විග්‍රහයක යෙදීම ය. ඒ අනුව ශ්‍රී ලංකාවේ හමුවන පැරණි බ්‍රාහ්මී ලිපි මෙහි ප්‍රධානතම මූලාශ්‍රය වේ. ඊට අමතර ව සාහිත්‍ය මූලාශ්‍රයන් ද පුරාවිද්‍යා සාධක ද මේ සඳහා ප්‍රයෝජනයට ගන්නා ලදි. ක්‍රි. පූ. 3 වන සියවසේ දී මහින්දාගමනයත් සමඟ ශ්‍රී ලංකාවට බුදු දහම පැමිණීමත් බ්‍රාහ්මී ලේඛන ක්‍රමය ආරම්භ වීමත් සිදුවීය යන අදහස බොහෝ දෙනා පිළිගත් ප්‍රචලිත මතයයි (රාහුල හිමි, 1993, පි. 52-64; සිරිසෝම, 1990, පි. 5-6). එහෙත් එම ධර්මදූතයන් වහන්සේලාට පෙර වෙළඳුන් මගින් බුදු දහම හා අක්ෂර පිළිබඳ දැනීම ශ්‍රී ලංකා වාසීන්ට ලැබී තිබෙන්නට ඇති බව ඇතැම් අය පෙන්වා දෙති (ප්‍රනාන්දු, 1969, පි. 19-20). අනුරාධපුරයේ ඇතුළු නගර පුරාවිද්‍යා කැණීම් මගින් ක්‍රි. පූ. 6වන සියවසේ සිට කියවා තේරුම්ගත හැකි බ්‍රාහ්මී ලේඛන මෙරට භාවිත වී ඇති බව පෙනී යයි (Deraniyagala, 1990, pp. 13-24; Coningham & Batt, 1999). එම අදහස පිළිගත හැකි නම්, කටාර කෙටූ ගල් ගුහාවල ඇති පැරණි ම බ්‍රාහ්මී ලේඛනවලින් ද සුළු කොටසක් හෝ ක්‍රි. පූ. 6 වන සියවසේ සිට ලියැවුණු ඒවා විය යුතුයැයි තර්ක කිරීමට කෙනෙකුට ඉඩකඩ ලැබේ.

ශ්‍රී ලංකාවේ කටාර කෙටූ ගල්ගුහාවල ඇති පැරණි ම ලේඛන සඳහා පිළිගත හැකි කාලනිර්ණ ක්‍රමයක් තවමත් හඳුන්වා දී නැත (සේනානායක, 2002, පි. 35-75). ලිපියේ අන්තර්ගත දේශපාලන ප්‍රභූන්ගේ නාම, වංසකථාවල එන දේශපාලන ප්‍රභූන්ගේ නාම සමඟ සසඳා බලා ඒ ඒ රජවරුන්ට මේ මේ ලිපි අයත් යයි නිගමනයකට එළැඹීමේ සාම්ප්‍රදායික ක්‍රමය වෙනස් කළ යුතු බව නූතන පුරාවිද්‍යා පර්යේෂණවල ප්‍රතිඵල අවධාරණය කරයි. මහාවංසය, දීපවංසය වැනි වංසකථාවල එන නම් සමඟ කිසිසේත් ම සැසඳිය නොහැකි රජවරුන් මහරජවරුන් හා වෙනත් දේශපාලන ප්‍රභූන් පිළිබඳ තොරතුරු ඇතැම් බ්‍රාහ්මී ලිපිවලින් හෙළිවන බව මෙයට පෙරාතුව පෙන්වා දී තිබේ (Gunawardana, 1982, pp. 1-39). මේ නිසා එම ලිපිවල නම් සඳහන් වන බෞද්ධ භික්ෂූන් වහන්සේලාගෙන් (තෙරවරුන් සහ ධර්මභාණක තෙරවරුන්ගෙන්) කිහිප දෙනෙකු හෝ දෙවන පෑතිස් රජතුමාගේ (ක්‍රි. පූ. 250-210) කාලයට වඩා පැරණි කාලයක විසූ අය වීමට බොහෝ දුරට ඉඩකඩ තිබේ. බ්‍රාහ්මී ලිපි හැරුණු විට පාලි අට්ඨකථා සහ සාහිත්‍ය මූලාශ්‍රය ග්‍රන්ථවල ද ඇතැම් තෙරුන් වහන්සේලා සහ ධර්මභාණක තෙරුන් වහන්සේලා පිළිබඳ ව කථා ප්‍රවෘත්තීන් ඇතුළත් වී තිබේ (අදිකාරම්, 1963, පි. 71-86; රාහුල හිමි, 1993, පි. 339-358).

**ඓතිහාසික පසුබිම**

බුදු දහම පිළිබඳ යම් අවබෝධයක් තිබූ පිරිසක් අශෝක රජුගේ (ක්‍රි. පූ. 272-232) අවධියට පෙර ශ්‍රී ලංකාවේ ජීවත් වන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. පුරාවිද්‍යා අධ්‍යයනයන් මගින් ද ඒ බව තහවුරු කළ හැකි සාධක හෙළිදරව් වී තිබේ. අනුරාධපුර ඇතුළු නගරය ආශ්‍රිත පුරාවිද්‍යා කැණීම්වලින් උතුරු ඉන්දියාව සමඟ ශ්‍රී ලංකාව ක්‍රි. පූ. 6 වන සියවසේ සිට සබඳතා පැවැත් වූ බව අනාවරණය වී ඇත. වයඹදිග ඉන්දියාව හරහා ගෙන්වන ලද අශ්වයා (Chandraratne, 2005, pp.35 ; 2007, pp.370-371) සහ මහජනපද යුගය හා සමපාත වන උත්තර උද්දීප්ත කාලවර්ණ භාජන මෙන් ම හස් එබූ කාසි අනුරාධපුරයේ යට ම පිහිටි පස්තට්ටුවලින් හමුවීම (Deraniyagala, 1990; Coningham & Batt, 1999) ඉතා ප්‍රබල පුරාවිද්‍යා සාක්ෂි ය. ඒ අනුව පැහැදිලි වන්නේ උතුරු ඉන්දියාවේ මහා ජනපද යුගයේ (බුදුන් වහන්සේ ජීවමාන ව සිටි අවධියේ) සිට ම කිසියම් සංස්කෘතික, දේශපාලන හෝ ආර්ථික සබඳතා ශ්‍රී ලංකාව සමඟ පවතින්නට ඇති බවයි.

බුදුන් වහන්සේ තුන්වරක් ම ශ්‍රී ලංකාවට පැමිණ යක්ෂ, රාක්ෂ, නාග, දේව ආදීන්ට ධර්මය දේශනා කළ බවත් භද්දකච්චායනා සහ ඇගේ සහෝදරයන් බුදුන් වහන්සේගේ සමීප ඥාතීන් බවත් පණ්ඩුකාභය රජතුමා තමන්ට සුදුසු මාළිග යක් ඉදිකරන තුරු අනුරාධපුරයේ සිටි තම මුත්තණු කෙනෙකු වූ අනුරාධගේ නිවාසයෙහි වාසය කළ බවත් පාළි වංසකථා අවධාරණය කරයි (දීපවංසය, 1970, I: 49-80, II: 11-69, X: 1-6, මහාවංස, 1959, I: 19-84, IX: 16-20, X: 6-12, 73-77). පණ්ඩුකාභය රජතුමා අනුරාධපුර නගරය ක්‍රමානුකූල නගරයක් ලෙස සංවර්ධනය කළ බව මහාවංසයේ 10 වන පරිච්ඡේදයේ සඳහන් වුවත් අවාසනාවකට මෙන් බෞද්ධයන් හෝ බෞද්ධ භික්ෂූන් ගැන කිසිදු තොරතුරක් එහි ඇතුළත් වී නැත. මෙකල නගර නිර්මාණ ශිල්පියෙකු ලෙස ප්‍රකට ව සිටියේ ජෝතිය නමැති ජෛන ආගමික නායකයෙකු බව (වංසත්ථප්පකාසිනී, 1994, පි. 223) අසන්නට ලැබේ. එය සැබෑවක් නම්, ඔහු මෙම නගරය තුළ ආගමික ස්ථාන සඳහා සුදුසු තැන් වෙන්කොට දීමේ දී තීරණාත්මක බලපෑමක් කරන්නට ඇතිවා නිසැක ය. මෙකල අනුරාධපුර නගරය තුළ බෞද්ධ භික්ෂු ආරාමයක් තිබූ බවක් හෝ බෞද්ධ භික්ෂු ආරාමයක් සඳහා සුදුසු භූමියක් වෙන්කළ බවක් වංසකථාවේ සඳහන් නොවේ. කෙසේ වෙතත් ජෛන ආරාම තුනක් සඳහා ම සුදුසු ස්ථාන වෙන්කොට ඒවා ඉදිකර දුන් පණ්ඩුකාභය රජතුමා (මහාවංස, 1959, X: 96-105) බෞද්ධ භික්ෂු ආරාමයක් සඳහා සුදුසු තැනක් වෙන් නොකළේ එකල බෞද්ධයන් හෝ බෞද්ධ භික්ෂූන් අනුරාධපුර නගරයෙහි නොසිටි නිසායැයි සිතතොත් එය මුළාවකි. පසුකාලයක දී බෞද්ධ රජවරුන් යටතේ පැරණි ජෛන විහාර සියල්ල බෞද්ධ විහාර බවට පත් වීම ජෛන හා බෞද්ධ දෙපිරිස අතර තිබූ බල අරගලයේ අවසන් ප්‍රතිඵලය විය හැකි ය. බල්ලාටනාග රජුගේ කාලයේ දී තිස්ස, අභය හා උත්තර යන කුමාරවරුන් තිදෙනා පිළිබඳ සිදුවීම (වංසත්ථප්පකාසිනී, 1994, පි. 490) මෙයට දේශපාලන පසුබිමක් තිබූ බව ඉඟි කරයි.

## පූර්ව පර්යේෂණ

ඊ. ඩබ්. අදිකාරම් (1963), වල්පොළ රාහුල හිමි (1993), පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි (1951) සහ යූ.ඩී. ජයසේකර (1993) ප්‍රධාන තවත් උගතුන් ගණනාවක් ම සාහිත්‍ය මූලාශ්‍රමය කරුණුවලට ප්‍රධානත්වය දෙමින් අතීත ශ්‍රී ලංකාවේ විසූ මහතෙරුන් වහන්සේලා සහ ධර්ම භාණක තෙරුන් වහන්සේලා පිළිබඳ බොහෝ කරුණු සාකච්ඡා කර තිබේ. එහෙත් බ්‍රාහ්මී ලිපිවල ඇතුළත් වන බෞද්ධ තෙරුන් වහන්සේලා හා සම්බන්ධ තොරතුරු කිසිවක් අධ්‍යයනය කර නැත. සෙනරත් පරණවිතාන ශ්‍රී ලංකාවේ ශිලාලේඛන පිළිබඳ ව ලියූ ග්‍රන්ථයේ (1970) පළමු වෙළුමෙහි බෞද්ධාගමට අයත් තෙරුන් වහන්සේලා සහ ධර්මභාණක තෙරුන් වහන්සේලා සම්බන්ධ ව ඉතා සංක්ෂිප්ත ව තොරතුරු ඉදිරිපත් කර තිබේ. ඒ හැරුණු විට එම ග්‍රන්ථයේ දෙවන වෙළුමෙහි පළමු කොටස (1983) සහ දෙවන කොටස (2001) යන ග්‍රන්ථවල ද තෙරුන් වහන්සේලා කිහිප දෙනෙකු පිළිබඳ ව තොරතුරු ඇතුළත් වේ.

## තෙරුන් වහන්සේලා

පැරැණි ම බ්‍රාහ්මී ලිපිවල තෙර (ස්ථවිර) යන උපධානයෙන් විශේෂණය වූ භික්ෂූන් වහන්සේලා එකසිය විසි දෙනමක් පිළිබඳ ව තොරතුරු ඇතුළත් වී තිබේ. මෙම එකසිය විසි දෙනම අතර එක ම තෙර කෙනෙකුගේ නාමය ලිපි කීපයක ම ඇතුළත් වන අවස්ථා හෝ එක ම නාමය සහිත තෙරවරුන් කිහිප දෙනෙකුගේ නම් ඇතුළත් වන අවස්ථා තිබීමට ඇති ඉඩකඩ බොහෝ ය. උදා: දමගුත තෙර නාමය සහිත ලිපි 9ක්, දමරකිත තෙර නාමය සහිත ලිපි 8ක්, තිශ තෙර නාමය සහිත ලිපි 8ක් ආදී වශයෙනි (වගු අංක 1 බලන්න). මේ අතර බ්‍රාහ්මී ලිපිවල එක් වරක් පමණක් නම සඳහන් වන තෙරුන් වහන්සේලා හතළිස් තුන්නමක් පිළිබඳ ව තොරතුරු හමුවී ඇත (වගු අංක 2(අ) සහ 2(ආ) බලන්න).

ක්‍රි. පූ. 3 වන සියවසේ දී ශ්‍රී ලංකාවට බුදු දහම ගෙන ආ බව කියන මහින්ද මහ රහතන් වහන්සේ ඇතුළු පිරිස පිළිබඳ ව අම්පාර දිස්ත්‍රික්කයේ රජගලින් හමු වූ ක්‍රි. පූ. 2 වන සියවසට අයත් යැයි සිතන බ්‍රාහ්මී ලිපියක සහ ක්‍රි. ව. 1 වන සියවසට අයත් මහා දාඨික මහානාග රජුට (ක්‍රි. ව. 6-21) අයත් මිහින්තලේ ගිරි ලිපියක තොරතුරු ඇතුළත් වී තිබේ (Paranavitana,

1970, No. 468; 1983, No. 21). රජගල ශිලා ලිපියේ ඇතුළත් වන්නේ මහින්ද තෙරණුවන්ගේ නාමය සහ ඉට්ඨිය තෙරණුවන්ගේ නාමය පමණක් වුවත් මිහින්තලයේ ශිලා ලිපියෙහි ඊට අමතර ව උත්තිය සහ භද්‍රසාල දෙදෙනාගේ නම් ද සඳහන් වී තිබේ. නමුත් බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් වන සම්බල තෙරණුවන්ගේ නාමය, සුමන සාමණේර නාමය සහ භණ්ඩුක උපාසක නාමය (දීපවංසය, 1970, XII: 12-13, 34-38; මහාවංස, 1959, XII: 7-8, XIII: 18-20) පැරණි බ්‍රාහ්මී ශිලාලේඛන කිසිවක සඳහන් වී නැත. සාහිත්‍ය ග්‍රන්ථවල මහතෙරුන් වහන්සේලා නැතිනම් මහ රහතන් වහන්සේලා නමින් හැඳින් වුණු මිහිඳු හිමියන්ගේ සහ අනෙකුත් තෙරුන් වහන්සේලාගේ නම් සඳහන් කිරීමේ දී මහ යන විශේෂණය කිසිදු බ්‍රාහ්මී ලිපියක භාවිත වී නැත. රජගල ලිපියෙහි මිහිඳු මහ රහතන් වහන්සේගේ නාමය සඳහන් වී ඇත්තේ *මහිද තෙර* යනුවෙන් පමණි (ඵලකය 01 බලන්න). මිහින්තලා ගිරිලිපියෙහි වුව ද *මහිද තෙර, භද්‍රසාල තෙර, ඉටික තෙර, උති තෙර* (Paranavitana, 1970, No. 468; 1983, No. 21) යැයි ඉතා සරල අයුරින් හඳුන්වා ඇත්තේ මිහිඳු මහ රහතන් වහන්සේ සහ ඒ සමඟ පැමිණි අනෙකුත් මහ රහතන් වහන්සේලාගේ නාමයන් ය. පැරැණි බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වන මලියදේව, මලයදේව හෝ මාලෙය්‍යදේව වැනි තෙරවරුන්ගේ නම් (මහාවංස, 1959, XXXII: 49-50; සිහළවත්ථුප්පකරණ, 1959, පි. 109, පි. 110, පි. 112; සහස්සවත්ථුප්පකරණ, 1959, පි. 120, පි. 152; මනෝරථපූරණී, 1923, පි. 22; පපංචසූදනී, 1952, පි. 219) මේ දක්වා කිසිදු බ්‍රාහ්මී ලිපියකින් හමු වී නැත.

දුට්ඨගාමිණී අභය රජුගේ (ක්‍රි. පූ. 161-137) කාලයේ සිටි උසස් භික්ෂූන් අතර *ගෝඨගත්ත තිස්ස* තෙරුන් වහන්සේට මුල්තැනක් හිමි වේ. කාකවණ්ණතිස්ස රජුගේ මරණින් පසු රජකම සඳහා දුටුගැමුණු හා යුද වැදුණු සද්ධාතිස්ස කුමාරයා පරාජය වී සැඟවී සිටි සමයේ මෙම සහෝදරවරුන් දෙදෙනා නැවත සාමදාන කරවීමට මූලිකත්වය ගත්තේ *ගෝඨගත්ත තිස්ස* නම් මහ තෙරුන් වහන්සේ බව මහාවංසය සඳහන් කරයි (මහාවංස, 1959, XXIV: 48-57). සද්ධාතිස්ස රජුගේ පුත්‍රයකු වූ ලජ්ජිතිස්ස රජු එම තෙරුන් සඳහා පෞද්ගලිකව ම විහාරයක් තනවා දුන් බව දූවේගල ශිලා ලිපියෙහි (Paranavitana, 1983, No. 15) සඳහන් වේ. එම රජතුමා පොදුවේ භික්ෂු සංඝයා සඳහා නොව එම තෙරුන් සඳහා ම විහාරයක් තනවා දුන්නේ ඉතා දුෂ්කර කාල පරිච්ඡේදයක දී තම පියාණන් වෙනුවෙන් කළ උපකාර නිසා විය හැකි ය. මෙසේ ගෝඨගත්ත තිස්ස තෙරුන්ට විහාරයක් තනවා දීම භික්ෂු සමාජය තුළ විවේචනයට භාජනය වූ බවක් දැනගන්නට නොලැබේ. එහෙත් ඊට පසු කාලයක දී වලගම්බා රජු තමන්ට බොහෝ උපකාර කළ කුපික්කලතිස්ස තෙරුන්ට විහාරයක් (අභයගිරිය) තනවා දුන්විට එම විහාරය භාර ගැනීම විනය විරෝධී ක්‍රියාවක් ලෙස සලකා දැඩි විවේචනයකට භාජනය විය (මහාවංස, 1959, XXXIII: 80-85; වංසත්ථප්පකාසිනී, 1959, පි. 497; නිකාය සංග්‍රහය, 1984, පි. 11-12; රාජරත්නාකරය, 1995, පි. 69). දුටුගැමුණු, සද්ධාතිස්ස හා ලජ්ජිතිස්ස වැනි රජවරුන්ගේ කාලවල දී ගෝඨගත්ත තිස්ස මහ තෙරුන්වහන්සේට බෞද්ධ භික්ෂූන් වහන්සේලා අතර තිබූ ගෞරවය හා පිළිගැනීම වලගම්බා රජුට උපකාර කළ කුපික්කලතිස්ස තෙරුන්වහන්සේට ලැබී නොතිබුණු බව මේ අනුව පැහැදිලි වේ. එක ම ආකාරයේ සිදුවීම් දෙකකින් පළමු සිදුවීම සාමාන්‍ය දෙයක් සේ සලකා නොසලකා හැරීමටත්, දෙවන සිදුවීම බරපතල වරදක් ලෙස සලකා කුපික්කලතිස්ස තෙරුන්ට විනයානුකූල ව දඬුවම් කිරීමටත් හේතු වූයේ ඒ නිසා විය යුතු ය. අභයගිරි මහා විහාරයෙහි නාග තෙරුන් වහන්සේ වාසය කළ පිරිවෙන් ගොඩනැගිල්ල සඳහා කළ දේපළ පරිත්‍යාගයක් පිළිබඳ ව ක්‍රි.ව. 2 වන සියවසට අයත් හීනුක්වැව ශිලා ලිපියෙහි සඳහන් වේ (Paranavitana, 2001, No. 186). මෙහි පොදුවේ අභයගිරි විහාරවාසී භික්ෂූන් සඳහා නොව පෞද්ගලික ව නාග නමැති තෙරුන් වහන්සේ කෙනෙකු වාසය කළ පිරිවෙන් ගොඩනැගිල්ල සඳහා එම ප්‍රදානය සිදු කළේ මෙම තෙරුන් වහන්සේ අභයගිරියේ විසූ මහතෙරුන් වහන්සේ කෙනෙකු ලෙස එකල පිළිගැනීමට ලක්වුණු නිසා විය හැකි ය. එම කාලයට ම අයත් කතරගම පුවරු ලිපියෙහි විස්තර වන්නේ අකුප් නමැති භික්ෂු පරපුරෙහි ආචාර්ය තෙරුන් වහන්සේලාගේ අනුමතිය ලබා ගෙන නන්ද නමැති තෙරණුවන් කතරගම ස්තූපයේ සතර දොරටුවෙහි පියගැට

පෙළ සකස් කළ බවයි (Paranavitana, 2001, No. 170). ක්‍රිස්තු වර්ෂ දෙවන සියවසේ දී කතරගම ප්‍රදේශයේ නායකත්වය දැරූ මෙබඳු භික්ෂු පරපුරක් හා එහි ප්‍රධානත්වය දැරූ ආචාර්ය තෙරුන් වහන්සේලා පිරිසක් පිළිබඳ ව වෙනත් කිසිදු මූලාශ්‍රයකින් තොරතුරු හමු වී නැත.

## තෙරණින් වහන්සේලා

බුද්ධ ශාසනය භික්ෂූන් වහන්සේලාගෙන් මෙන් ම භික්ෂුණීන් වහන්සේලාගෙන් ද සකස් වූවක් විය. තෙර (ස්ථවිර) නාමයෙන් හඳුන්වා ඇත්තේ ජ්‍යෙෂ්ඨත්වයට පත් වූ උසස් භික්ෂූන් වහන්සේලා ය. ඒ අතර ස්ථවිරීන් වහන්සේලා ද සිටියහ. නමුත් ශ්‍රී ලංකාවේ බ්‍රාහ්මී ලිපිවල *ශමණි*, *ශමණිය* (ශ්‍රමණීය/මෙහෙණින් වහන්සේ) යන නාම මිස (Paranavitana, 1970, No. 8, No. 161b, No. 224, No. 969) තෙරණීන් වහන්සේලා යන තේරුම දෙන යෙදුම් ඇතුළත් බ්‍රාහ්මීලිපි කිසිවක් මේ දක්වා වාර්තා වී නැත. ශමණි, ශමණිය යන වචනවලින් අර්ථවත් වන්නේ භික්ෂුණිය යන අර්ථයයි. තෙරණිය නමින් හඳුන්වන්නේ භික්ෂුණීන් අතරත් උසස් තත්ත්වයට පත්වූ ජ්‍යෙෂ්ඨ භික්ෂුණීන් වහන්සේලා ය. මහාවංසයේ සංඝමිත්තා මහ තෙරණිය සමග තවත් තෙරණින් වහන්සේලා එකොළොස් නමක් ශ්‍රී ලංකාවට පැමිණි බව සඳහන් ව තිබේ (මහාවංස, 1959, XIX: 5-6). පැරැණි ම වංසකථාව වූ දීපවංසයෙන් තෙරණින් වහන්සේලා පිළිබඳ ව මහාවංසයටත් වඩා තොරතුරු අනාවරණය වේ. සංඝමිත්තා තෙරණිය සමග *උත්තරා*, *හේමා*, *මාසගල්ලා*, *අග්ගිමිත්තා*, *තප්පා*, *පබ්බතච්ඡින්නා*, *මල්ලා* සහ *ධම්මදාසිකා* ආදි රහත් භාවයට පත් වූ මහා තෙරණිවරුන් ද මෙහි පැමිණි බව ප්‍රකාශ වේ (දීපවංසය, 1970, XV: 76-80). මේ පිරිස ශ්‍රී ලංකාවේ දී පැවිදි වූ භික්ෂුණීන් වහන්සේලාට විනය පිටකයට අයත් ග්‍රන්ථ පහ සහ අභිධර්ම සප්තප්‍රකරණය ද ඉගැන්වූ බව සඳහන් ව තිබේ (දීපවංසය, 1970, XVIII: 11-14). මෙම තෙරණිවරුන් ඒ ඒ ධර්ම කොටස් මතකයෙහි ධාරණය කොට තබාගෙන සිටි ධර්මභාණක තෙරණින් වහන්සේලා විය හැකි ය. ඒ අනුව ශ්‍රී ලංකාවේ දී ධර්ම විනය හදාරා ප්‍රබුද්ධත්වයට පත්වූ අනුලා දේවිය ඇතුළු *සද්ධම්මනන්දි*, *සෝමා*, *ගිරිද්ධී*, *දාසිකා*, *ධම්මා*, විනය විශාරද වූ *ධම්මපාලා*, *සෝභනා*, *ධම්මතාපසා*, *නරමිත්තා*, *සාථා* ආදි මහ තෙරණිවරුන් අනුරාධපුරයෙහි විසූ බව සඳහන් වේ. මේ හැරුණු විට රුහුණු රටේ වාසය කළ *චූළනාගා*, *දත්තා*, *සෝණා*, *සණ්හා*, *ගමික ධීතා*, *මහා තිස්සා*, *මහා සුමනා*, *චූල සුමනා*, *මහාකාලී* ආදි තෙරණිවරුන් පිළිබඳවත් තොරතුරු හෙළිදරව් වේ (දීපවංසය, 1970, XVIII: 11-42). මේ කිසිදු තෙරණියක පිළිබඳ ව බ්‍රාහ්මී ලිපිවලින් තොරතුරු හෙළිදරව් නොවීම කණගාටුවට කරුණකි.

## ධර්මභාණක මහ තෙරුන් වහන්සේලා

වර්තමානයෙහි උගත් පුද්ගලයා යනු බොහෝ පොතපත ඇසුරු කළ බොහෝ පොතපත කියැවූ පුද්ගලයා ය. එහෙත් අතීතයේ දී ඥාන මාර්ග යෙහි ප්‍රධාන තැනක් ශ්‍රැතියට හිමි විය. එසේම බොහෝ ඇසූපිරූ තැනැත්තා බහුශ්‍රැතයකු ලෙස හැඳින්විණි. එහෙයින් බොහෝ දේ අසා දැන ගැනීමත් ඒවා හැකිතරම් සිය මතකයෙහි ධාරණය කර තබා ගැනීමත් උගතාගේ සිරිත විය. මේ අනුව පැරණි අධ්‍යාපනයේ ප්‍රධානතම ලක්ෂණය වූයේ ධාරණය කොට තබා ගැනීම නැති නම් කටපාඩම් කර තබා ගැනීම විය (රාහුල හිමි, 1993, පි. 340). ඉන්දියාවේ විසූ පැරණි බ්‍රාහ්මණ ගුරුවරු වේදයේ ආරක්ෂාව සඳහා ලේඛන ක්‍රමය උපයෝගී කරගන්නට පසුබට වූහ. එය කට වචනයෙන් ම ආරක්ෂා කර තබාගැනීම ලේඛන ගත කිරීමට වඩා සුදුසු යැයි මුල්කාලයේ දී කල්පනා කළ බව පෙනේ (පරණවිතාන, 1969, පි. 47).

පළමුවන ධර්ම සංගායනාව සහ දෙවන ධර්ම සංගායනාව සිදුවන කාලය වන විට ඉන්දියාව තුළ ලේඛන ක්‍රමයක් තිබූ බවට පැහැදිලි සාක්ෂි හමු නොවේ. ඒ අනුව භික්ෂූන් වහන්සේලාට සියලු ධර්මය සිය මතකයෙහි ධාරණය කර තබා ගැනීමට සිදු විය. පළමුවන ධර්ම සංගායනාවෙන් පසු එයට මූලික වූ මහතෙරුන් වහන්සේලාට සහ ඔවුන්ගේ ශිෂ්‍ය අනු ශිෂ්‍ය පිරිස්වලට කටපාඩම් කර ගැනීම සඳහා කොටස් වශයෙන් ධර්මය බෙදා දෙන ලද බව කියවේ (කළුපහණ, 1961, පි. 116). එම තෙරුන් වහන්සේලා තමන්ට පැවරුණු ධර්ම කොට්ඨාසය අමතක වීම වැළැක්වීම සඳහා එම ධර්මය නැවත නැවත

ගායනා කිරීමෙන් මතකය අළුත්කර ගන්නා ලදී. එසේ ධර්මය කටපාඩමින් කියැවීමෙහි යෙදී සිටි නිසා *ධර්මභාණකයන්* ලෙස ඔවුන් හැඳින්වීම සිරිතක් බවට පත් විය (අදිකාරම්, 1963, පි. 170-171). මේ අයුරින් සියවස් කිහිපයක් ගත වන තුරු බුද්ධ ධර්මය කටපාඩම් කිරීම අනුව ම පැවත ආයේ යැයි කියැවේ. ප්‍රකට මජ්ඣිම භාණකවරයෙකු වූ දේව තෙරුන් වහන්සේ වර්ෂ 19 ක් ම ධර්මය සංගායනා නොකොට භාවනා යෝගීව සිටියත් දැනුමේ කිසිදු අඩුවක් නොවූ බවත්, පෙර පරිදි ම මුල සිට අගට *මජ්ඣිම නිකාය* ගායනා කිරීමේ හැකියාව උන්වහන්සේට තිබූ බවත් පැවසේ (විසුද්ධිමග්ගෝ, 1919, පි. 71; රාහුල හිමි, 1993, පි. 301). එකල භික්ෂු ආවාසයත් අධ්‍යාපන ආයතනයත් දෙකක් නොව එකක් විය. ඒ නිසා පිරිවෙන (*පරිවේණ*) නමින් හඳුන්වා ඇත්තේ භික්ෂූන් වාසය කළ ස්ථානයයි. ගුරුවරයා සමීපයේ වාසය කරමින් අධ්‍යාපනය හැදෑරීම පැරණි සම්ප්‍රදාය විය (රාහුල හිමි, 1993, පි. 299-315) වලගම්බා රජුගේ කාලයේ දී ධර්මය ග්‍රන්ථාරූඪ කළ බව සඳහන් වුවද සියලුම ධර්මය ඒ අවස්ථාවේ දී ම ග්‍රන්ථාරූඪ කර නිමකළ බවක් පිළිගත නොහැකි ය (කළුපහණ, 1961, පි. 117). ඒ අනුව ඇතැම් ධර්ම කොටස් එයින් පසුවත් ග්‍රන්ථාරූඪ වන්නට ඇත. එහෙයින් ලේඛන කටයුතු ආරම්භ වුව ද තවත් සියවස් ගණනාවක් ගතවන තුරු ම ධර්ම ග්‍රන්ථවලට වඩා මෙම ධර්මභාණකයන් වහන්සේලාට මුල් තැනක් ලැබී තිබුණු බව පිළිගත යුතු වේ. ත්‍රිපිටකයේ ඒ ඒ කොටස් කටපාඩම් කළ භික්ෂූන් වහන්සේලා එම ධර්ම කොට්ඨාසයේ නමින් උපපද යොදා හැඳින් වුණු අතර ඔවුන් ඒ නමින් ගුරුකුල පවා ඇතිකරගත් බව හෙළි වේ. විනය පිටකයේ කොටස් පාඩම් කළ පිරිස විනයධර වූ අතර සූත්‍ර පිටකය පාඩම් කළ පිරිස *සුත්ත භාණක (සුතත බණක)* නම් විය. සූත්‍ර පිටකයේ ද කොටස් පැවතුණු අතර ඒ කොටස් කටපාඩම් කරගත් අය ඒ ඒ ධර්ම කොටස් අනුව හඳුන්වනු ලැබූහ (පරණවිතාන, 1969, පි. 50-56). පාලි අට්ඨ කථා හා සෙසු සාහිත්‍ය ග්‍රන්ථවල සඳහන් වන තොරතුරු විමසා බලමින් පැරණි ධර්මාභාණකයන් පිළිබඳ විවරණයක් ඊ. ඩබ්. අදිකාරම් විසින් ඉදිරිපත් කර තිබේ (1693, පි. 70-88). එහෙත් ශ්‍රී ලංකාවේ හමුවන පැරණි ම බ්‍රාහ්මී ලිපිවල ඇතුළත් වන ධර්ම භාණකයන් පිළිබඳ තොරතුරු ඔහුගේ විමර්ශනයට භාජනය වී නැත. වල්පොළ රාහුල හිමියන්ගේ (1993) සහ පොල්වත්තේ බුද්ධදත්ත නාහිමියන්ගේ (1951) ප්‍රකාශනවලත් ඒ තත්ත්වය ම දක්නට ලැබේ.

ශ්‍රී ලංකාවේ බ්‍රාහ්මී ලිපිවල ධර්මභාණක තෙරුන් වහන්සේලා ගණනාවක් පිළිබඳ තොරතුරු ඇතුළත් වී පවතී. සූත්‍ර පිටකයට අයත් *මජ්ඣිම නිකාය* හදාළ බරත නම් ගෝත්‍රයට අයත් *මජ්ඣිම භාණක* නම් තෙරුන් වහන්සේ කෙනෙකු පිළිබඳ ව වවුනියාව දිස්ත්‍රික්කයේ එරුපොතාන ලිපියක සඳහන් වේ (Paranavitana, 1970, No. 330). එහෙත් එම ලිපියේ ම සඳහන් වන එම තෙරුන්ගේ උපාධ්‍යායවරයා (ගුරුවරයා) වූ තිස්සගුත්ත තෙරුන්ට *මජ්ඣිම භාණක* යන විශේෂණය යොදා නැත. මෙබඳුම තවත් බ්‍රාහ්මී ලිපියක් දඹුල්ලෙන් හමු වී ඇත (Paranavitana, 1970, No. 852) එහි ද තිස්ස ගුත්ත තෙරුන්ගේ සද්ධිවිහාරික (ශිෂ්‍යයෙකු) වූ මජ්ඣිම භාණකවරයෙකු ගැන සඳහන් වේ (ඵලකය 02 බලන්න). මෙහි තිස්ස ගුත්ත තෙරුන් හැඳින්වීම සඳහා මජ්ඣිම භාණක යන විශේෂණය භාවිත වී නැත. මෙයින් පැහැදිලි වන්නේ ඇතැම් විට උපාධ්‍යායවරයා (ගුරුවරයා) මජ්ඣිම භාණකයෙකු නොවූව ද සද්ධිවිහාරිකයා (ශිෂ්‍යයා) මජ්ඣිම භාණකයෙකු වූ බවක් ද? ගුරු ශිෂ්‍ය පරම්පරාව අනුව කටපාඩම් කිරීම මගින් පවත්වාගෙන ගිය සුවිශේෂ ධර්ම කාණ්ඩයක් සම්බන්ධයෙන් ගුරුවරයාට නැති ප්‍රවීණත්වයක් ශිෂ්‍යයාට තිබූ බව ප්‍රකාශ වීම ගැටලුවකි. බුදු සසුනෙහි පැවිදිවන සෑම භික්ෂුවකට ම උපාධ්‍යායවරයා සහ ආචාර්යවරයා යනුවෙන් ගුරුවරු දෙදෙනෙක් වූහ. උපාධ්‍යායවරයා යනු ඒ භික්ෂුව පැවිදිකරගත් භික්ෂූන් වහන්සේ ය. ආචාර්යවරයා යනු අධ්‍යාපනය හා ශිල්ප ශාස්ත්‍ර උගැන්වූ භික්ෂූන් වහන්සේ ය (මහාවග්ග පාලි, 1957, පි. 94-132). මේ නිසා ඉහත කී සද්ධිවිහාරිකයන් දෙදෙනා මජ්ඣිම භාණක තත්ත්වයට පත් වූයේ සිය උපාධ්‍යායවරයා අනුව නොව ආචාර්යවරයා අනුව යමින් අන්තේවාසිකයෙකු ලෙසින් දැයි සැක සිතේ. එහෙත් පැරණි මූලාශ්‍රයවල සඳහන් වන තෙරුන් වහන්සේලා වැඩි දෙනා උපාධ්‍යායවරුන් වෙතින් ධර්මය හදරා ධර්මයේ ප්‍රවීණත්වය ලද සද්ධිවිහාරික භික්ෂූන් වහන්සේලා වූහ. උපාලි මහරහතන් වහන්සේ යටතේ විනය පිටකය හදාළ

ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සමන්තපාසාදිකාවෙහි හඳුන්වා ඇත්තේ *සද්ධිවිහාරික* යන නාමයෙනි (සමන්තපාසාදිකා, 1945, පි. 35-36). මිහිඳු මහරහතන් වහන්සේ සද්ධිවිහාරිකයා ලෙසත් මොග්ගලීපුත්ත තිස්ස මහරහතන් වහන්සේ මිහිඳු මහරහතන් වහන්සේගේ *උපාධ්‍යායවරයා* ලෙසත් වංසකථා හඳුන්වා දෙයි (මහාවංස, 1959, V: 207; වංසත්ථප්පකාසිනී, 1994, පි. 107). මහින්ද මහරහතන් වහන්සේගේ *අන්තේවාසික* ලෙස අරිට්ඨ තෙරණුවන් ද එම තෙරණුවන්ගේ අන්තේවාසිකයන් ලෙස *තිස්සගුත්ත, කාලසුමන,* දීඝසුමන ආදී විනය පිටකයේ ප්‍රවීණත්වය ලද සෙසු තෙරුන් වහන්සේලා ද සිටි බව සමන්තපාසාදිකාව තව දුරටත් විස්තර කරයි (සමන්තපාසාදිකා, 1929, පි. 74).

ඉහත කී එරුපොතාන ලිපියේ සහ දඹුල්ල ලිපියේ (Paranavitana, 1970, No. 330, No. 852) සඳහන් වන ආකාරයේ තිස්ස ගුත්ත නම් තෙරුන්වහන්සේ කෙනෙකු ගැන රජගල, බඹරගස්තලාව (එලකය 03 බලන්න), කොටාදැමුහෙලල නුවරකන්ද (Paranavitana, 1970, No. 447, No. 508, No. 520, No. 572, No. 573, No. 915) යන ස්ථානවලින් හමුවූ ලිපිවල සඳහන් වුවත් ඒ කිසිදු ලිපියක ධර්මභාණක බව හඟවන විශේෂණ පද භාවිත වී නැත. මේ අතර *මජ්ඣිම නිකාය* හා *දීඝනිකාය* යන නිකාය දෙකම හදාළ බත තිස (තෙරණ) නම් කෙනෙකු ගැන පියන්ගල ලෙන් ලිපියක සඳහන් වන බව එල්ලාවල මේධානන්ද හිමි පෙන්වා දෙයි (1999, 20). දඹුල්ලේ ලෙන් ලිපියක මජ්ඣිම භාණක තෙරුන් වහන්සේ කෙනෙකු ගැන සඳහන් වුවත් (Paranavitana, 1970, No. 852) එම තෙරුන්ගේ පෞද්ගලික නාමය එම ලිපියේ සඳහන් නොවේ. එතුමා තිස්ස ගුත්ත නම් තෙණුවන්ගේ ශිෂ්‍යයෙකු බව පමණක් සඳහන් කර තිබේ. ඉහත කී එරුපොතාන ලිපියේ කියැවුණු මජ්ඣිම භාණක තෙරුන්ගේ ගුරුවරයා ද තිස්ස ගුත්ත නම් විය. එසේම දඹුල්ල ලිපියේ මජ්ඣිම භාණක තෙරුන්ට බත යන විශේෂණය ද එරුපොතාන ලිපියෙහි එන මජ්ඣිම භාණක තෙරුන්ට බරත යන විශේෂණය ද යෙදී ඇත. මෙම *බත* සහ *බරත* යනු එක සමාන අර්ථය ඇති යෙදුම් දෙකක් බව සුදර්ශන් සෙනෙවිරත්නගේ පිළිගැනීම විය (1998, පි. 49-56). ඒ අනුව එරුපොතාන ලිපියේ එන තෙරවරුන් දෙදෙනා ම දඹුල්ල ලිපියේ සඳහන්වනවා ඇතැයි අනුමාන කළ හැකි ය. රුහුණේ මුල්ගිරිගල විහාර ලිපියක ද මජ්ඣිම භාණක බත *උපශොණ* නම් තෙරුන් වහන්සේ කෙනෙකු ගැන සඳහන් වේ (Paranavitana, 1970, No. 708). මේ අනුව පැරණි ශිලා ලිපිවල හමුවන සියලුම මජ්ඣිම භාණක තෙරවරුන් බරත හෝ බත යන නාමයෙන් විශේෂණය කොට දක්වා තිබීම ද සැලකිය යුතු කරුණක් වේ.

සංයුක්ත භාණක ගුරු ශිෂ්‍ය දෙනමක් පිළිබඳ ව තොරතුරු රුහුණු ප්‍රදේශයේ ගෝනගල ශිලා ලිපියකින් හෙළිදරව් වේ (Paranavitana, 1970, No. 666). එහි සංයුක්ත භාණක තිස්ස නම් තෙරණුවන් සහ එම තෙරුන්ගේ සද්ධිවිහාරික සංයුක්ත භාණක බත *චුඩිතිස* නම් තෙරුණුවන් පිළිබඳවත් සඳහන් වේ (එලකය 04 බලන්න). *චුඩි* යනු, *චුල්ල* එසේ නැති නම් බුද්ද යන අර්ථය පළ කිරීමක් විය යුතු ය. එසේ නම් එම විශේෂණ පදය සහිත මහ තෙරුන් වහන්සේලා කිහිප දෙනෙකු පාලි අට්ඨ කථාවලින් ද හමුවන බව කිව යුතු වේ. එක් තෙරනමක් දුටුගැමුණු රජුගේ සොහොයුරු සද්ධාතිස්ස රජුගේ සමයේ (ක්‍රි. පූ. 137-119) දී ප්‍රකට වූ *මංගණ විහාර වාසී කුජ්ජතිස්ස* තෙරණුවෝ ය. එහෙත් අටුවාවන්හි එම තෙරුන්ට සංයුක්ත භාණක යන විශේෂණය යෙදී නැති බව කියැවේ (බුද්ධදත්ත හිමි, 1951, පි. 54-58; අදිකාරම්, 1963, පි. 158).

අංගුත්තර නිකාය භාණකයන් පැරණි බ්‍රාහ්මී ලිපිවල හඳුන්වා ඇත්තේ එක *උතිරිකබණක* යනුවෙනි. එබඳු එක *උතිරික බණක චුස්සදේව* නම් තෙරණු කෙනෙකු ගැන අම්පාර දිස්ත්‍රික්කයේ මියුගුණාවෙහෙර බ්‍රාහ්මී ලිපියක (එලකය 05 බලන්න) තොරතුරු සඳහන් වන අතර (Paranavitana, 1970, No. 407). තවත් එබඳු ලිපියක් පුළුකුණාව කන්දේ ගල් ගුහාවකින් ද හමු වී ඇත (මේධානන්ද හිමි, 1999, පි. 36). එහි අංගුත්තර නිකාය භාණක බත ශොන නමැති තෙරුන් වහන්සේ පිළිබඳ ව සඳහන් වේ. අංගුත්තර නිකාය භාණකයන් ගැන කියැවෙන බ්‍රාහ්මී ලිපි හමු වී ඇත්තේ දෙකක් පමණක් බව කිව යුතු ය.

ත්‍රිපිටකයෙහි වැදගත් ම කොටස විනය පිටකයයි (ධම්මකුසල නා හිමි, 1975. පි. 13). එසේම විනය පිටක භාණකයන් විනයධර යන නමින් හැඳින්වීම සම්ප්‍රදාය විය. අම්පාර දිස්ත්‍රික්කයේ බඹරගස්තලාව සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කදුරුවැව යන පුරාවිද්‍යා ස්ථානවලින් හමු වූ ශිලාලිපි දෙකක විනයධර තෙරුන් වහන්සේලා පිළිබඳ ව තොරතුරු වාර්තා වී තිබේ. ඒ පිළිවෙළින් *විනයදර පුශ* තෙරුන් සහ *විනයදර දත* තෙරුන් යනුවෙනි (Paranavitana, 1970, No. 1178; No. 1207). බඹරගස් තලාවෙන් *විනයදර පුශ* තෙරුන් ගැන කියන තවත් ලිපියක් හමු වී ඇතැයි වාර්තා වේ (මේධානන්ද හිමි, 1999, අංක 29). පාලි අට්ඨකථාවල සඳහන්වන *විනයධර ඵුස්සදේව* නම් තෙරණුවන් (සමන්තපාසාදිකා, 1929, පි. 188-189; බුද්ධදත්ත නාහිමි, 1951, පි. 78). මෙම බ්‍රාහ්මී ලිපිවල කියැවෙන විනයදර පුශ තෙරණුවන් විය හැකි දැයි තවදුරටත් සොයා බැලීම සුදුසු ය. මේ හැරුණු විට *පුශදෙව* තෙර නමින් හැඳින් වූ තවත් භික්ෂූන් වහන්සේ කෙනෙකු ගැන සිතුල්පව්වේ කොරවක්ගල පුරාවිද්‍යා ස්ථානයෙන් ලැබෙන බ්‍රාහ්මී ලිපියක ද සඳහන් වේ (Paranavitana, 1970, No. 628). එහෙත් එම තෙරුන් හැඳින්වීම සඳහා *විනයදර* යන විශේෂණය භාවිත කර නැත. *විනයදර ඵුස්සදේව* තෙරණුවන්, *විනයදර උපතිස්ස* තෙරණුවන්, *විනයදර මහාපදුම* තෙරුණුවන්, *විනයදර මහාසුම්ම* තෙරණුවන් වැනි විනය පිටකධාරී මහතෙරුන් වහන්සේලා කිහිප දෙනෙකු පිළිබඳව ම විස්තර පාලි අට්ඨකථාවල ඇතුළත් වී පවතී (සමන්තපාසාදිකා, 1945, පි. 383, පි. 388, පි. 398, පි. 422, පි. 429; බුද්ධදත්ත නා හිමි, 2002, පි. 95-99). මෙබඳු නම් ඇති තෙරවරුන් පිළිබඳ ව පැරණි බ්‍රාහ්මී ලිපිවල විස්තර සඳහන් ව ඇතත් (Paranavitana, 1970, No. 228, No. 407, No. 628, No. 1135, No. 1191), ඒ කිසිවෙකුත් විනයදර ධර්මභාණකයන් ලෙස එම බ්‍රාහ්මී ලිපිවල හඳුන්වා දී නැත. අරිට්ඨ මහා තෙරණුවන් ශ්‍රී ලාංකිකයකු ලෙස ප්‍රථම වරට විනය පිටකය හදාරා එය මහින්ද මහරහතන් වහන්සේ ඇතුළු මහා සංඝසභාව ඉදිරියෙහි නිවැරදි ව ගායනා කර පෙන්වූ බවත්, ශ්‍රී ලංකාව තුළ බුදු දහම මුල් බැස ගත්තේ එයින් පසුව බවත් වංසකථා අවධාරණය කරයි. අරිට්ඨ තෙරණුවන්ගේ සද්ධි විහාරිකයන් ද ඒ අයුරින් ම විනය පිටකය හදාරා පරපුරෙන් පරපුරට එය පවත්වාගෙන ගිය බවත් එය විස්තර කරයි (මහාවංස, 1959, XXXIV: 61-62; සමන්තපාසාදිකා, 1929, පි. 188-189). එහෙත් ඊට සමීප කාලයක ලියැවුණු බ්‍රාහ්මී ලිපිවල මෙම අරිට්ඨ තෙරණුවන් හෝ එම තෙරුන්ගේ සමීප ශිෂ්‍යයන් බව කියැවෙන තෙරවරුන් පිළිබඳවත් කිසිවක් සඳහන් වී නොතිබීම කණගාටුවට කරුණකි.

අභිධර්ම පිටකය හෝ එහි කොටසක් උගත් භාණකවරුන් පිළිබඳවත් බුද්දක නිකාය උගත් භාණකවරුන් පිළිබඳවත් තොරතුරු කිසිවක් මේ දක්වා හමු වී ඇති බ්‍රාහ්මී ලිපිවලින් හෙළිදරව් නොවේ. මේ ගැන කරුණු ප්‍රකාශ කරන පරණවිතාන කියා සිටියේ මෙම අවධිය වන විට එම ධර්ම කොටස් ශ්‍රී ලංකාව තුළ නොපැවතුණු බව ය (Paranavitana, 1970, p. CVII). මහාවිහාරයේ විසූ ආභිධම්මික ගෝදත්ත තෙරුන් පිළිබඳවත් අභිධර්මයට අයත් උභතෝ විභංගභාණක පුණ්ණවාලිකවාසී මහාතිස්ස නම් තෙරුන් වහන්සේ පිළිබඳවත් විනය අටුවාවේ තොරතුරු ඇතුළත් වේ (සමන්තපාසාදිකා, 1945, පි. 464). පැරණි ම බ්‍රාහ්මී ලිපි 3 ක (Paranavitana, 1970, No. 588, No. 590, No. 965) මහාතිස්ස නමින් හැඳින්වෙන තෙරණ කෙනෙකු ගැන සඳහන් වුවත් ඒ කිසිවක අභිධර්ම භාණක යන විශේෂණය භාවිත කර නැති නිසා විනය අටුවාවේ සඳහන් වන මහා තිස්ස තෙරුන් සහ බ්‍රාහ්මී ලිපිවල සඳහන් වන මහා තිස්ස තෙරුන් අතර යම් සම්බන්ධයක් තිබුණා දැයි පැහැදිලි නැත. එහෙත් මේ අතර *සුතන පලිබණක හලණ කුල* යයි හැඳින්වෙන පිරිසක් පිළිබඳ ව කුරුණෑගල දිස්ත්‍රික්කයේ කදුරුවැව ශිලා ලේඛනයකින් අනාවරණය වේ (ඵලකය 06 බලන්න). මෙහි *සුතන පලිබණක* යනු සූත්‍ර පිටකය හදාළ යන තේරුම දෙන බවත් *කුල* යනු ඒ ධර්ම කොටස උගත් ගුරු ශිෂ්‍ය පරම්පරාව බවත් පරණවිතාන විසින් ම පහදා දී තිබේ (1970, No. 1202). ඒ අනුව සූත්‍ර පිටකය හදාළ ගුරු ශිෂ්‍ය පරම්පරාවක් අතීත ශ්‍රී ලංකාවේ විසූ බව පිළිගැනීමට සිදුවේ. වලගම්බා රජුගේ මුල් අවදියේ පැවතුණු *බැමිණිටියා* සාගත කාලයේ වාසය කළ *චතුනිකායික තිස්ස* නම් තෙරණ කෙනෙකු ගැන විනය අටුවාවේ නිසග්ගිය වණ්ණනාවේ සඳහන් වන බව පෙන්වා දී ඇත

(බුද්ධදත්ත නාහිමි, 1951, පි. 152). චතුනිකායික යනු සූත්‍ර පිටකයට අයත් *දීඝනිකාය, මජ්ඣිම නිකාය, සංයුක්ත නිකාය, අංගුත්තර නිකාය* යන නිකාය සතරෙහි ම ප්‍රවීණත්වය ලද භික්ෂූන් වහන්සේලා විය යුතු ය. මීට අමතර ව දීඝනිකාය සහ මජ්ඣිම නිකාය යන නිකාය දෙකම හදාළ භාණක වරයෙකු පිළිබඳ ව පියංගල ශිලා ලිපියක (මේධානන්ද හිමි, 1999, පි. 20) සඳහන් වන බව ඉහත සඳහන් විය. දීඝනිකාය පමණක් හදාළ භික්ෂූන් වහන්සේලා ගැන ශිලා ලිපිවල සඳහන් නොවුණත් (Paranavitana,1970, p. CVII). එම දීඝනිකාය ද ඇතුළත් ව නිකාය සතර ම උගත් භික්ෂූන් වහන්සේලා ලංකාවේ වාසය කළ බව පාලි අට්ඨකථාවල සඳහන් වන බව ද අමතක නොකළ යුතු ය. මේ නිසා දීඝභාණකයන් මුල් ම කාලයේ ලක්දිව නොසිටියේ යැයි සිතීම සාධාරණ නොවේ.

ශ්‍රී ලංකාවේ ජාතක කථා දේශනා කළ ජාතක භාණකවරුන්ද සිටිය බවට තොරතුරු මූලාශ්‍රය වෙතින් හෙළි වේ. ඉළනාග රජු (ක්‍රි. ව. 93-102) රුහුණේ තුළාධාර පබ්බතයේ දී ජාතක භාණක මහාපදුම තෙරුන් වෙතින් මහාකපි ජාතකය පිළිබඳ බණ ඇසූ බව මහාවංසය කියයි (1959, XXXV: 30-31) මෙම ජාතක භාණකවරුන් ධර්ම භාණකයන් අතර සිටි පැරණි ම පිරිස බව පිළිගැනීම විය (අදිකාරම්, 1963, පි. 83). ජාතකකථා දේශනා කළ තවත් තෙරුන් වහන්සේ කෙනෙකු ගැන අංගුත්තර නිකාය අටුවාවේ සඳහන් වේ (මනෝරථපූරණී, 1923, පි. 386; බුද්ධදත්ත නාහිමි, 2002, පි. 143-144). ගාථා දහසකින් යුක්ත වෙස්සන්තර ජාතකය ඇසීමට තිස්ස මහාවිහාරවාසී භික්ෂුවක් දීඝවාපියේ විසූ මහාජාතක භාණක තෙරුන් වහන්සේ වෙත ගිය බව එහි සඳහන් වේ. ශ්‍රී ලංකාවේ පැරණි ම බ්‍රාහ්මී ලිපිවල ජාතක භාණකවරුන් ගැන සඳහන් ව නැතත් නැගෙනහිර පළාතේ කරඳහෙලෙන් හමු වූ ක්‍රි.ව. 2 වන සියවසට පමණ අයත් එක් බ්‍රාහ්මී ලිපියක ජාතක භාණකවරයෙකු ගැන තොරතුරු හමුවේ (Paranavitana, 2001, No. 171a). ජාතක භාණක නාග (*ජතක බණක නග තෙර*) තෙරණුවන්ට අයත් පියගැටපෙළක් පිළිබඳ ව එහි සඳහන් වේ.

පැරණි බ්‍රාහ්මී ලිපිවල සම්පූර්ණ ත්‍රිපිටකය ම හදාළ (ත්‍රිපිටකධාරී) මහ තෙරවරුන් ගැන කිසිවක් සඳහන් නොවුණත් පාලි අට්ඨකථාවල එබඳු තෙරවරුන් ගැන සඳහන් වන බව දක්නට ලැබේ. *ත්‍රිපිටක භාණක තිස්ස* නම් මහතෙරණ කෙනෙකු ත්‍රිපිටකය තවදුරටත් පිරිසිදු කර දැන ගැනීම සඳහා විදේශගත වූ බව ද වාර්තා වේ (සාරත්ථප්පකාසිනි, 1930, පි. 191; බුද්ධදත්ත නා හිමි, 2002, පි. 164). තිස්ස තෙරණුවන්ගේ නම (තිශ තෙර යන නාමය) සඳහන් වන පැරණි බ්‍රාහ්මී ලිපි අටක් ශ්‍රී ලංකාවෙන් හමුවී ඇතත් (Paranavitana, 1970, No. 219, No. 327, No. 666, No. 597, No. 603, No. 705, No. 1172, No. 1228) ඒ කිසිවක තිස්ස තෙරණුවන් ධර්මභාණක බව ඇඟවීම සඳහා යොදන කිසිදු විශේෂණයක් භාවිත කර නැත. මේ හැරුණු විට ත්‍රිපිටකධාරී චූලනාග හා ත්‍රිපිටකධාරී මහාසිව යන තෙරවරුන්ගේ නම් ද පාලි අට්ඨකථාවල (මනෝරථපූරණී, 1923, පි. 24; සාරත්ථප්පකාසිනී, 1927, පි. 201; පපංචසූදනී, 1952, පි. 219, පි. 242) සඳහන් වන අතර කිසිදු බ්‍රාහ්මී ලිපියක එම තෙරවරුන්ගේ නම් සඳහන් වී නැති බව කිවයුතු වේ. ත්‍රිපිටකධාරී මහාසිව තෙරණුවන් අටළොස් මහා ගණයන්ට ත්‍රිපිටකය පෙළ වශයෙන් ද අර්ථ වශයෙන් ද ඉගැන්වූ අතර ඒ තෙරුන්ගේ ඉගැන්වීම් අනුගමනය කළ විශාල භික්ෂු පිරිසක් රහත් භාවයට පත් වූ බව ද අට්ඨකථාවල විස්තර වේ (මනෝරථපූරණී, 1923, පි. 24) අතීතයේ විසූ ධර්ම භාණක මහා තෙරවරුන් ඉතාමත් නිහතමානී අය වූ බවත්, ගුරුවරයාත් ශිෂ්‍යයාත් අතර ධර්ම කරුණක් සම්බන්ධයෙන් මතභේදයක් ඇති වූ විට ශිෂ්‍යයා නිවැරදි බව හැඟී ගියහොත් තම ශිෂ්‍යයා පළකරන මතය නිවැරදි බව ගුරුවරයා විසින් පිළිගත් අවස්ථා තිබුණු බවත්, ත්‍රිපිටකධාරී චුල්ල සුම්ම තෙරණුවන් තම ශිෂ්‍යයා වූ ත්‍රිපිටකධාරී චුල්ල නාග තෙරුණුවන්ගේ මතය නිවැරදි බව පිළිගෙන ඒ බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළ බවත් සඳහන් ව තිබේ (පපංචසූදනී, 1952, පි. 208, පි. 219; රාහුල හිමි, 1993, පි. 309). මාර්ගඵලලාභී හෝ මහරහත් භාවයට පත් වූ තෙරවරුන් පවා තමන් ඒ තත්ත්වයට පත්වී සිටින බව හෙළිදරව් කළේ එසේ කිරීමට අවශ්‍ය ම වූ අවස්ථාවක පමණි. නැතහොත් තමන් පත් වී ඇති උසස් තත්ත්වය ගැන කිසිවෙකුටත් නොදන්වා නිහඬ

ව සිටීම සාමාන්‍ය සම්ප්‍රදාය විය. මේ අනුව ඒ ඒ ධර්ම කොට්ඨාසවල ප්‍රවීණත්වය (ධර්මභාණක තත්ත්වය) ඇතත් ඒ බව මහජනතාවට හෙළි නොකළ (ප්‍රසිද්ධියේ ප්‍රකාශ නොකළ) නිහතමානී මහතෙරවරුන් ද සිටින්නට ඇතිවා නිසැක ය. මේ නිසා තෙරවරුන්ගේ නම් ශිලාලිපිවල සටහන් කර තැබීමේ දී ධර්මභාණක බව හඳුනාගෙන සිටි තෙරවරුන්ගේ නම් ඒ ලිපිවල ඒ අයුරින් ම ඇතුළත් කළත්, ධර්මභාණක තත්ත්වය ඇති බව නොදන්නා තෙරවරුන්ගේ නම් ඒ විශේෂණ පදය රහිත ව සටහන් කර තබන්නට ඇතැයි සිතිය හැකි ය.

## නිගමනය

ශ්‍රී ලංකාවේ භික්ෂු අධ්‍යාපනය සම්බන්ධයෙන් වංසකථාවල ඇතුළත් වන තොරතුරු පැරණි බ්‍රාහ්මී ලිපිවල ඇතුළත් වන තොරතුරු සමඟ සසඳා බැලීමක් මෙහි දී සිදු විය. ඒ අනුව පැරණි වංසකථාවල වර්ණනාත්මක ව සඳහන් ව තිබූ ඇතැම් කරුණු ඉතා සංක්ෂිප්ත ව බ්‍රාහ්මී ලිපිවලින් ඉදිරිපත් වී තිබෙන බව පැහැදිලි විය. භික්ෂුණීන් වහන්සේලා පිළිබඳ ව සඳහන් වුවත් තෙරණීන් වහන්සේලා පිළිබඳ ව කිසිදු තොරතුරක් හෙළිදරව් නොවීම විශේෂත්වයකි. ධර්ම භාණකයන් වහන්සේලාගේ තොරතුරු සාහිත්‍ය මූලාශ්‍රයවල සවිස්තරාත්මක ව අන්තර්ගත වුවත් රහතන් වහන්සේලා යන අර්ථය දෙන විශේෂණ පදයක් ඒ කිසිවෙකු සඳහා මෙම ශිලා ලිපිවල භාවිතාවී නැත. අන්තේවාසික (ශිෂ්‍ය) භික්ෂූන් වහන්සේලාගේ විශේෂඥතාවය පෙන්වීමට භාවිත කළ උපපද සමහර අවස්ථාවල භික්ෂු අධ්‍යාපනයේ නියමුවන් වූ මහතෙරුන් වහන්සේලාත් ධර්මභාණකයන් වහන්සේලාත් සඳහා යෙදී නැත. මේ නිසා සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් වී ඇති කරුණුවලට වඩා පැරණි බ්‍රාහ්මී ලිපිවල තොරතුරු සමකාලීන වන බැවින් ඓතිහාසික නිගමනවලට එළැඹීමේ දී එම තොරතුරු වඩාත් ප්‍රතිජානාත්මක වන බව අවධාරණය කරමු.

වගු අංක 1: ලිපි කිහිපයක නම සඳහන් වන තෙරුන් වහන්සේලා

| තෙරණුවන්ගේ නාමය | ශිලාලේඛන අංක (Paranavitana,1970) |
|---|---|
| අනද තෙර (ආනන්ද තෙරණුවෝ) | 155, 845 |
| බුදරකිත තෙර (බුද්ධරක්ඛිත තෙරණුවෝ) | 252, 455, 1066 |
| දමගුත තෙර (ධම්මගුප්ත තෙරණුවෝ) | 60,154,519,584,682, 13, 920,1091,1159,1194 |
| දමරකිත තෙර (ධම්මරක්ඛිත තෙරණුවෝ) | 76,363,448,386,976,1072,1175,893a |
| දමරුචි තෙර (ධම්මරුචික තෙරණුවෝ) | 437,438,466,572,996 |
| දත තෙර (දත්ත තෙරණුවෝ) | 70,13,1134,1207 |
| මහතිශ තෙර (මහාතිස්ස තෙරණුවෝ) | 590,588,965 |
| මිත තෙර (මිත්ත තෙරණුවෝ) | 478,1133 |
| නග තෙර (නාග තෙරණුවෝ) | 458,1040 |
| නගශෙන තෙර (නාගසේන තෙරණුවෝ) | 451,602,609 |
| නුගතෙර (නිග්‍රෝධ තෙරණුවෝ) | 1062,1063 |
| පුශ තෙර (ඵුස්ස තෙරණුවෝ) | 226,444,1068,1178,1223 |
| පුශ දෙව තෙර (ඵුස්සදේව තෙරණුවෝ) | 407,628 |

| තෙරණුවන්ගේ නාමය | ශිලාලේඛන අංක (Paranavitana,1970) |
|---|---|
| සිරි ගුත තෙර (ශ්‍රී ගුප්ත තෙරණුවෝ) | 535,229 |
| ශිවතෙර (සිව තෙරණුවෝ) | 431,499,450 |
| සුකධත තෙර (සුජාත තෙරණුවෝ) | 271,512 |
| සුමන තෙර (සුමන තෙරණුවෝ) | 151,173,327,732 |
| සුමනගුත තෙර (සුමනගුප්ත තෙරණුවෝ) | 570,571 |
| තිශ තෙර (තිස්ස තෙරණුවෝ) | 219,327,666,597,603,705,1172,1228 |
| තිශගුත තෙර (තිස්ස දත්ත තෙරණුවෝ) | 330,447,508,520,572,573,915,852 |
| තිශමිත තෙර (තිස්ස මිත්‍ර තෙරණුවෝ) | 461,463,464 |
| තිශරකිත තෙර (තිස්ස රක්ඛිත තෙරණුවෝ) | 220,769,232 |
| උපතිශ තෙර (උපතිස්ස තෙරණුවෝ) | 225,1135 |
| වෙශ තෙර (වෙස්ස තෙරණුවෝ) | 214,215,1204 |


වගු අංක 2 (අ): එක් බ්‍රාහ්මී ලිපියක පමණක් නම සඳහන් වන තෙරුන් වහන්සේලා

| තෙරණුවන්ගේ නාමය | ශිලාලේඛන අංක (Paranavitana,1970) |
|---|---|
| අනුරද තෙර (අනුරාධ තෙරණුවෝ) | 593 |
| අපය තෙර (අභය තෙරණුවෝ) | 1206 |
| අශලි තෙර (අස්ලිස තෙරණුවෝ) | 306 |
| බගිනිය තෙර (භාගිනෙයිය තෙරණුවෝ) | 614 |
| ගුත තෙර (ගුප්ත තෙරණුවෝ) | 841 |
| හුමන තෙර (සුමන තෙරණුවෝ) | 1196 |
| ඉදරකිත තෙර (ඉන්ද රක්ඛිත තෙරණුවෝ) | 641 |
| ඉඩික තෙර (ඉටිඨිය තෙරණුවෝ) | 468 |
| ඉසිරකිත තෙර (ඉසි රක්ඛිත තෙරණුවෝ) | 614 |
| ඝඩිත තෙර (ජිත තෙරණුවෝ) | 1090 |
| කෙඩාතිසේන තෙර (කෙඩාතිසේන තෙරණුවෝ) | 1 |
| කුබිර තෙර (කුබේර තෙරණුවෝ) | 469 |
| කුමර තෙර (කුමාර තෙරණුවෝ) | 688 |
| මහ පුශතෙර (මහා ඵුස්ස තෙරණුවෝ) | 956 |
| නද තෙර (නන්ද තෙරණුවෝ) | 220 |
| මිත ගුත තෙර (මිත්ත ගුප්ත තෙරණුවෝ) | 716 |
| නදික තෙර (නන්දික තෙරණුවෝ) | 457 |
| නුගය තෙර (නිග්‍රෝධ තෙරණුවෝ) | 732 |

| තෙරණුවන්ගේ නාමය | ශිලාලේඛන අංක (Paranavitana,1970) |
|---|---|
| පුණ තෙර (පුණ්ණ තෙරණුවෝ) | 668 |
| පුශ ගුත තෙර (ඵුස්ස ගුප්ත තෙරණුවෝ) | 715 |
| මහිද තෙර (මහින්ද තෙරණුවෝ) | 468 |
| රකිත තෙර (රක්ඛිත තෙරණුවෝ) | 1181 |
| රෙත තෙර (රේවත තෙරණුවෝ) | 653 |
| රොණිගුත තෙර (රෝහිණී ගුප්ත තෙරණුවෝ) | 926 |
| ශගරකිත තෙර (සංඝ රක්ඛිත තෙරණුවෝ) | 509 |
| ශගත තෙර (ස්වාගත තෙරණුවෝ) | 574 |
| ශිවගුත තෙර (ශිව ගුප්ත තෙරණුවෝ) | 841 |
| ශිවනුබුතිය තෙර (ශිවානුභූති තෙරණුවෝ) | 608 |
| ශොන තෙර (සෝන තෙරණුවෝ) | 505 |
| ශොන ගුත තෙර (සෝන ගුප්ත තෙරණුවෝ) | 41 |
| සුම තෙර (සුම්ම තෙරණුවෝ) | 1191 |
| සුමන දත තෙර (සුමන දත්ත තෙරණුවෝ) | 1 |
| ශුරිතෙර (සූර්ය තෙරණුවෝ) | 454 |
| ශුවිශක තෙර (සුවිසාඛ තෙරණුවෝ) | 787 |
| තිශබුති තෙර (තිස්ස භූති තෙරණුවෝ) | 456 |
| උතර තෙර (උත්තර තෙරණුවෝ) | 613 |
| උතර ගුත තෙර (උත්තර ගුප්ත තෙරණුවෝ) | 815 |
| උති තෙර (උත්තිය තෙරණුවෝ) | 1197 |
| වෙශලි තෙර (වෛශාලි තෙරණුවෝ) | 517 |

වගු අංක 2 (ආ): එක් බ්‍රාහ්මී ලිපියක පමණක් නම සඳහන් වන තෙරුන් වහන්සේලා


| තෙරණුවන්ගේ නාමය | ශිලාලේඛන අංක (Paranavitana,1970; 1983) |
|---|---|
| මහිද තෙර (මහින්ද තෙරණුවෝ) | 21 |
| භදසාල තෙර (භද්දසාල තෙරණුවෝ) | 21 |
| ඉටික තෙර (ඉට්ඨිය තෙරණුවෝ) | 21 |
| උති තෙර (උත්තිය තෙරණුවෝ) | 21 |
| ගොතගතක තිස තෙර (ගෝධගත්ත තිස්ස තෙරණුවෝ) | 15 |




ඵලකය 01: මෙම දිවයිනට මුලින් ම පැමිණි ඉට්ඨිය තෙරණුවන්ගේ සහ මහින්ද තෙරණුවන්ගේ ස්තූපය පිළිබඳ ව සඳහන් වන රජගල ගිරි ලිපිය (Paranavitana, 1970, No. 468)



ඵලකය 02: තිස්ස ගුත්ත තෙරුන්ගේ සද්ධිවිහාරික බත මජ්ඣිමභාණක තිස්ස තෙරුන් පිළිබඳ ව සඳහන් වන දඹුල්ල ලෙන් ලිපිය (Paranavitana, 1970, No. 852)




ඵලකය 03: තිස්ස ගුත්ත තෙරණුවන් ගැන සඳහන් වන බඹරගස්තලාව ලිපිය (Paranavitana, 1970, No. 520)



ඵලකය 04: සංයුක්තභාණක තිස්ස තෙරණුවන්ගේ සද්ධිවිහාරික වූ සංයුක්තභාණක බත චුඩි තිස්ස තෙරුන් ගැන සඳහන් වන ගෝනගල ලෙන් ලිපිය (Paranavitana, 1970, No. 666)



ඵලකය 05: අංගුත්තරනිකාය භාණක ඵුස්සදේව තෙරණුවන් පිළිබඳ ව සඳහන් වන මියුගුණා වෙහෙර ලෙන් ලිපිය (Paranavitana, 1970, No. 407)



ඵලකය 06: සූත්‍ර පිටකය හදාළ හලණ නමැති භික්ෂු පරම්පරාව පිළිබඳ ව සඳහන් වන කදුරුවැව ලිපිය (Paranavitana, 1970, No. 1202)

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලිපි


අදිකාරම්, ඊ. ඩබ්. (1963). *පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය*. කොළඹ: ජී. කේ. ජී. ජයවර්ධන සහ සමාගම.

කළුපහන, පී. එච්. ජිනදාස (1961). පාලි සාහිත්‍යය. අමරදාස ලියනගමගේ සහ රණවීර ගුණවර්ධන (සංස්.). *අනුරාධපුර යුගය* (පි. 116-125). කොළඹ: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය.

ජයසේකර, යූ. ඩී. (1993). ලක්දිව පැරණි අධ්‍යාපන ආයතන. *අධ්‍යාපනය*, අංක 23 කලාපය, 48-59.

දීපවංසය (1970). කිරිඇල්ලේ ඥානවිමල හිමි (සංස්.). කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

*නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය* (1984). බන්දුසේන ගුණසේකර (සංස්.). කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ ප්‍රකාශන.

*පපංචසූදනීනාම මජ්ඣිමනිකායට්ඨකථා - IV කොටස* (1952). විද්‍යාලංකාර පරිවෙණාධිපති ධම්මානන්දාභිධාන මහාථෙර (සංස්.). කොළඹ: සිරිනාථ කුමාරදාස මුනසිංහ සහ විමලධර්ම හේවාවිතාරණ ප්‍රකාශන..

පරණවිතාන, සෙනරත් (1969). මහාවිහාරය හා වෙනත් විද්‍යාපීඨ. *ලංකාවේ අධ්‍යාපනය*. සියවස ප්‍රකාශන, 1 කාණ්ඩය, 49-56.

ප්‍රනාන්දු පී. ඊ. ඊ. (1969). සිංහල අක්ෂර මාලාවේ ආරම්භය. *ලංකාවේ අධ්‍යාපනය පුරාතන යුගය*, සියවස ප්‍රකාශන, 1 කාණ්ඩය, 19-24.

බුද්ධදත්ත නාහිමි, පොල්වත්තේ (2002). *අටුවා*

පරීක්ෂණය හා අටුවා කථාවස්තු. කැළණිය, අම්බලන්ගොඩ, විල්ලේගොඩ: පී.එම්.ඩබ්. පියරත්න විසින් ප්‍රකාශිතයි.

*මනෝරථපූරණී අංගුත්තර නිකායට්ඨකථා - I භාගය* (1929). විද්‍යාලංකාර පරිවෙණාධිපති ධම්මකිත්ති සිරිධම්මානන්ද ථෙර (සංස්.). කොළඹ: චාල්ස් අල්විස් හේවාවිතාරණ සහ සිරිනාථ කුමාරදාස මුනසිංහ ප්‍රකාශන.

*මහාවග්ග පාලි - ප්‍රථම භාගය* (1957). අම්බලන්ගොඩ ධම්මකුසල නාහිමි (සංස්.). කොළඹ: ලංකාණ්ඩුව මගින් ප්‍රකාශිතයි.

*මහාවංස - ඌනපූරණසහිතො මහාවංසො* (1959). පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි (සංස්.). කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම.

මේධානන්ද හිමි, එල්ලාවල (1999). *අප්‍රකට බ්‍රාහ්මී ලෙන් ලිපි*. කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

*රාජරත්නාකරය* (1995). කරුණාදාස රූපසිංහ (සංස්.). කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රාහුල හිමි, වල්පොල (1993). *ලංකාවේ බුදුසමයේ ඉතිහාසය*. කොළඹ: සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

*වංසත්ථප්පකාසිනී* (1994). අකුරැටියේ අමරවංස නාහිමි සහ හේමචන්ද්‍ර දිසානායක (සිංහල අනුවාදය). කැලණිය: පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය.

*විසුද්ධිමග්ගෝ* (1919). පමුණුවේ බුද්ධදත්ත ථෙර (සංස්.). කොළඹ: සිරිනාථ කුමාරදාස මුනසිංහ ප්‍රකාශන.

*සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා - පඨමො භාගෝ* (1929). කහවේ ශ්‍රී සුමංගල රතනසාර මහාථෙර (සංස්.). කොළඹ: සිරිනාථ කුමාරදාස මුනසිංහ ප්‍රකාශන.

*සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා - දුතියො භාගෝ* (1945). බද්දේගම පියරතන ථෙර සහ වැලිවිටියෝ සෝරත ථෙර (සංස්.). කොළඹ: විමලධර්ම හේවාවිතාරණ සහ සිරිනාථ කුමාරදාස මුනසිංහ ප්‍රකාශන.

*සහස්සවත්ථුප්පකරණ* (1959). පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි (සංස්.). අම්බලන්ගොඩ: ආනන්ද පොත් සමාගම.

*සාරත්ථප්පකාසිනී නාම සංයුක්තනිකායට්ඨකථා - දුතියෝ භාගෝ* (1927). විදුරුපොල පියතිස්ස මහාථෙර (සංස්.). කොළඹ: සිරිනාථ කුමාරදාස මුනසිංහ ප්‍රකාශන.

*සාරත්ථප්පකාසිනී නාම සංයුක්තනිකායට්ඨකථා - තතියෝ භාගෝ* (1930). විදුරුපොල පියතිස්ස මහාථෙර (සංස්ග). කොළඹ: සිරිනාථ කුමාරදාස මුනසිංහ ප්‍රකාශන.

සිරිසෝම, එම්. එච්. (1990). ශ්‍රී ලංකාවේ පැරණි බ්‍රාහ්මී සෙල්ලිපි. නන්දදේව විජේසේකර (සංස්.). *අභිලේඛන*, ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශතසංවත්සර සමරු පොත් පෙළ, දෙවන වෙළුම (පි. 1-55). කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

*සීහළවත්ථුපකරණ* (1959). පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි (සංස්.). කොළඹ: ඇම්. ඩබ්ලිව්. අභයසිරි විසින් ප්‍රකාශිතයි.

සේනානායක, පියතිස්ස (1993). ශ්‍රී ලංකාවේ පැරණි අධ්‍යාපනයේ ආරම්භය පිළිබඳ ව පුරාවිද්‍යාත්මක නිරීක්ෂණයක්. ගොඩගම මංගල හිමි (සංස්.). *සිංහල සාහිත්‍යයේ හෙළිපෙහෙළි* (පි. 97-101). කොළඹ: ශ්‍රී සුමංගල විද්‍යාලය, මහනුවර.

සේනානායක, පියතිස්ස (2002). ශ්‍රී ලංකාවේ පැරණි ම ලේඛන සහ ඒවායේ ආරම්භය පිළිබඳ ව අදහසක්. දයා අමරසේකර සහ රෝහිත දසනායක (සංස්.). *ඉඳුවර පර්යේෂණාත්මක ලේඛන සංග්‍රහය - ඉතිහාසය* (පි. 35-75). වරකපොල: ආරිය ප්‍රකාශකයෝ.

Chandraratne, R.M.M. (2005). Horse Remains from the Jetawana Pilimage Excavation, Central Cultural Fund, Anuradhapura. *Proceedings of the Peradeniya University Research Sessions*, Sri Lanka, Vol.10, 35.

Chandraratne, R.M.M. (2007). Idenfification of Mule (Equus hemionus) as Aśvataraya in Ancient Sri Lanka by Unearthed Bones and Literature. *Proceedings of the Peradeniya University Research Sessions*, Sri Lanka, Vol.12, Part II, 370-371.

Cunningham, Robin and Cathy Batt (1999). Dating the sequence Anuradhapura. *The British Sri Lankan Excavation at Anuradhapura Salgaha Watta* 2, Vol. I. 125-141.

Deraniyagala S.U. (1990). List of Radio Carbon Dates: Proto and Early Historic Periods. Sudarshan Seneviratne and others (Eds.), *Perspectives in Archaeology - Leelananda Prematillake Festschrift* (PP. 13-24). Peradeniya: Department of Archaeology, University of Peradeniya.

Gunawardane, R.A.L.H. (1982). Prelude to the State: An early phase in the evolution of political institution in ancient Sri Lanka. *The Sri Lanka Journal of the Humanities*, Vol. VIII, No. 1&2, 1-39.

Paranavitana, Senarat (1929). Pre-Buddhist Religious Belifes in Ceylon. *Journal of the Royal Asiatic Society of Sri Lanka*, XXXI, No. 82 202-328.

Paranavitana, Senarat (1970). *Inscriptions of Ceylon,* Vol. I. Colombo: Archaeological Survey of Ceylon.

Paranavitana, Senarat (1983). *Inscriptions of Ceylon*, Vol. II, Part 1. Colombo: Archaeological Survey of Ceylon.

Paranavitana, Senarat (2001). *Inscriptions of Ceylon*, Vol. II, Part 2. Colombo: Archaeological Survey of Ceylon.

Seneviratna, Sudharshan (1985). The Baratas: A Case of Community integration in Early historic Sri Lanka. In A.R.B. Amarasinghe & Sumanasekara Banda (Ed.), *Festschrift James Ratnam* (PP. 49-56). Colombo.